Forum on Disarmament & Development

නිරවිකරණය සහ සංවර්ධනය පිළිබඳ සංසදය
ஆயுதக் களைவு மற்றும் அபிவிருத்திக்கான மன்றம்
**Forum on Disarmament and Development**
No 69, Gregory's Road, Colombo 07, Sri Lanka. Telephone/Fax +94-11-267-1988

2019.02.12

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති
ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා
ජනාධිපති ලේකම් කාර්යාලය
කොළඹ 01.

ගරු ජනාධිපතිතුමනි,

**සයිටීස් 18 මහ සමුළුව (CITES CoP18) මෙම වසරේ මැයි / ජුනි මාසයන් තුළ පැවැත්වීමට ප්‍රථම ප්ලාස්ටික් සහ පොලිතින් භාවිතය තහනම් කිරීම.**

මෙම වසරේ මැයි / ජුනි මාසයන් තුළ ශ්‍රී ලංකාව වඳවීමේ තර්ජනයට භාජනය වී ඇති වන සතුන් හා ශාකවල ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය (සයිටීස් - CITES) 18 වන පාර්ශවකරුවන්ගේ සමුළුව (CoP18) නැමැති ලොව විශාලතම වන ජීවී හා සම්බන්ධ සමුළුව පැවැත්වීමට කටයුතු සූදානම් කරමින් සිටී. එක්සත් ජාතීන් හා සම්බන්ධ වන මෙම සමුළුව නිදහසින් පසු ශ්‍රී ලංකාවේ පවත්වනු ලබන විශාලතම අන්තර්ජාතික සමුළුව වනු ඇත. මෙම සමුළුවට 3500 - 4000 ක පමණ විදේශ සහභාගීත්වයක් පැමිණෙනු ඇතැයි අපේක්ෂා කරයි. නිරවිකරණය සහ සංවර්ධනය පිළිබඳ සංසදය වන අප සයිටීස් 18 වන මහ සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වීම පිළිබඳව ඉතාමත් සතුටු වන්නෙමු. ඉතා මෑතකදී අප සංසදය මගින් සයිටීස් සහ ශ්‍රී ලංකාව යන මැයෙන් කෘතියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් එළිදක්වන ලදී.

අද ලෝකයේ ශ්‍රී ලංකාවද ඇතුළුව ඉමහත් පාරිසරික ගැටළුවක් බවට පත්වී ඇති ප්ලාස්ටික් සහ පොලිතීන් භාවිතයෙන් ස්වාභාවික පරිසරය විනාශ කරමින් පවතී. මෙය සමස්ථ මිනිස්, සත්ව සහ පාරිසරික ප්‍රජාවෙහි අනාගත පැවැත්මට තර්ජනයක්ව පවතී. මේ පිළිබඳව ඉතාමත් සුභදායි හා යහපත් ප්‍රතිඵල අත්කර දෙන්නා වූ ක්‍රියාදාමයනට ලොව සමහර රාජ්‍යයන් කටයුතු කරමින් පවතී. එනමුත් කණගාටුදායක තත්වය වනුයේ ශ්‍රී ලංකාව ප්ලාස්ටික් සහ පොලිතින් තහනම් කිරීමේ වැඩපිළිවෙල සහ එයට විසඳුම් සෙවීම තවම ඉතා මන්දගාමී අයුරින් සිදුවීමයි. ප්ලාස්ටික් සහ පොලිතින් භාවිතය නිසා ශ්‍රී ලංකාවේ සමස්ථ පරිසර පද්ධතියම දැඩි අවධානමකට ලක්ව ඇති අතර, විශේෂයෙන්ම ගොඩබිම සහ සාගරය තුළ ජීවත් වන්නා වූ සත්වයන්ගේ පැවැත්මට මෙය තර්ජනයක්ව ඇත.

තවද ශ්‍රී ලංකාව ප්ලාස්ටික් සහ පොලිතින් සාගරයට මුදාහරින ප්‍රධාන රටක් ලෙසට ප්‍රචලිත වී ඇති අතර, වඳවීමේ තර්ජනයට භාජනය වී ඇති ශ්‍රී ලංකානු අලින් සහ දිවියන් වැනි සත්වයින් පොලිතීන් ආහාර වශයෙන් අනුභව කිරීම පිළිබඳව නිතර ජන මාධ්‍ය තුළින් අනාවරණය කරනු ලැබේ. මෙම සයිටීස් අන්තර්ජාතික සමුළුව තුළදී මේ පිළිබඳව රජය අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම පිළිබඳව ශ්‍රී ලංකාව අපකීර්තියට පත්වීමේ හැකියාව ඉතා ඉහළය.

සයිටීස් සමුළුව පැවැත්වීමට ප්‍රථම ශ්‍රී ලංකාව ප්ලාස්ටික් සහ පොලිතින් භාවිතය තුරන් කිරීමට කටයුතු කරන රටක් ලෙස කටයුතු කිරීම මෙහිලා ඉතා වැදගත්ය. විශේෂයෙන්ම රජයේ ආයතන සහ සංචාරක හෝටල් පද්ධතියේ දායකත්වය මෙහිදී කැපී පෙනේ. ගරු ජනාධිපතිතුමා පාරිසරික අමාත්‍යවරයා ලෙස මෙහිදී වගකීමෙන් සහ ආදර්ශමත් ලෙස රජයේ පූර්ණ සහයෝගය ඇතිව කටයුතු කරනු ඇතැයි අප

බලාපොරොත්තු වනු ලැබේ. මෙහිදී අප පහත සඳහන් ක්‍රියාකාරකම් ඔබතුමා ප්‍රමුඛ රජයෙන් බලාපොරොත්තු වන්නෙමු.

01. පාර්ලිමේන්තුව, ජනාධිපති ලේකම්කාර්යාලය (ජනාධිපති මන්දිරයද ඇතුලුව) සහ අග්‍රාමාත්‍ය කාර්යාලය (අරලියගහ මන්දිරයද ඇතුළුව) පොලිතීන් සහ ප්ලාස්ටික් තොර කලාපයන් ලෙස නම් කිරීම. මෙම ලිපිය සමග මෙම ආයතනයන්හි ප්ලාස්ටික් වතුර බෝතල භාවිතා වන ඡායාරූප සහ ප්ලාස්ටික් සහ පොලිතීන් වලින් ශ්‍රී ලංකාවේ ස්වභාවික පරිසරයට සිදුවන හානිය හුවා දැක්වෙන ඡායාරූප කිහිපයක් අමුණා ඇත.

02. අමාත්‍යංශ සහ අනෙකුත් රාජ්‍ය ආයතනයන් තුළ පිරිසිදු පානීය ජලය ලබාදීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම සහ ප්ලාස්ටික් වතුර බෝතල් භාවිතය තහනම් කිරීම මගින් රජයේ ආයතන රට වැසියාට ආදර්ශමත් වීමත්,

03. [illegible] භාවිතා කළ හැකි වතුර බෝතල් භාවිතයට යොමු කිරීම සහ සමස්ථ පාසල් පද්ධතිය ප්ලාස්ටික් සහ පොලිතීන් වලින් තොර කලාප ලෙස නම් කිරීම.

04. සංචාරක හෝටල් ව්‍යාපාරයේ නිරත ප්‍රධාන සමාගම් සඳහා ප්ලාස්ටික් සහ පොලිතීන් භාවිතය තහනම් කිරීමට කටයුතු කිරීම. අප පසුගිය වසරේ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ සභාපතිතුමා හට ලිඛිතව මේ පිළිබඳව සාකච්ඡාවක් හෝටල් සමාගම් සමග පැවැත්වීමට ඉල්ලා සිටියද, අද දක්වා යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැත. ඒ පිළිබඳව යවන ලද ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.

05. මීතොටමුල්ල කුණු කන්ද නාය යාමත් සමඟ ඇති වූ මහත් ආන්දෝලාත්මක තත්ත්වය සමඟ අප විසින් ශ්‍රී ලංකාවේ කසල ප්‍රතිචක්‍රීකරණය සඳහා අවශ්‍ය කසල ප්‍රතිචක්‍රීකරණ කම්හල් (Re Cycling Plants) ශ්‍රී ලංකාව තුළ පිහිටුවීමේ ඇති වැදගත්කම පෙන්වා දුනි. කුණු කන්ද නාය ගොස් වසර 02 ක් ආසන්න වුවද කොළඹ නගරය තුළ තවමත් එක් හෝ කසල ප්‍රතිචක්‍රීකරණ කම්හලක් පිහිටුවීමට අපොහොසත් වී ඇත. මෙය හැකි ඉක්මනින් ස්ථාපිත කළ යුතුය.

ඉහත සඳහන් කරන ලද අවශ්‍යතා ඔබතුමා ප්‍රමුඛ රජයට සයිටීස් 18 සමුළුවට ප්‍රථම කිරීමට හැකියාවක් නොමැති යැයි අප නොසිතන්නෙමු. මේ පිළිබඳව කථිකාවක් සඳහා ගරු ජනාධිපතිතුමා සමඟ හැකි ඉක්මනින් අපහට සාකච්ඡාවක් ලබාදෙන මෙන් මෙයින් කාරුණිකව ඉල්ලා සිටිමු.

මෙයට - විශ්වාසී,


V. Abey...

.............................



විද්‍යා අබේගුණවර්ධන
සම්බන්ධීකාරක
නිරවිකරණය සහ සංවර්ධනය පිළිබඳ සංසදය
විද්‍යුත් තැපැල : vidyampa@hotmail.com
ජංගම දුරකථන : 0773559878


පිටපත් :
01. ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා
02. ගරු කථානායක කරු ජයසූරිය මැතිතුමා
03. ගරු සංචාරක වනජීවි සහ ක්‍රිස්තියානි කටයුතු පිළිබඳ අමාත්‍ය ජෝන් අමරතුංග මැතිතුමා
04. ගරු අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මැතිතුමා


05. ගරු අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය වජිර අබේවර්ධන මැතිතුමා
06. ගරු නගරාධිපතිනි රෝසි සේනානායක මැතිණිය, කොළඹ මහ නගර සභාව
07. ජනාධිපති ලේකම් උදය රංජිත් සෙනෙවිරත්න මහතා
08. අග්‍රාමාත්‍ය ලේකම් සමන් ඒකනායක මහතා
09. සංචාරක, වනජීවී සහ ක්‍රිස්තියානි කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ ලේකම් එස්. හෙට්ටිආරච්චි මහතා
10. පරිසර සහ මහවැලි කටයුතු අමාත්‍යංශයේ ලේකම් අනුර දිසානායක මහතා
11. අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් පද්මසිරි ජයමාන්න මහතා
12. අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශයේ ලේකම් එච්.ටී. කමල් පද්මසිරි මහතා
13. වනජීවී අධ්‍යක්‍ෂක ජනරාල් එම්.ජී.සී. සූරියබණ්ඩාර මහතා
14. කොළඹ මහ නගර සභා නාගරික කොමසාරිස් වී.කේ.ඒ. අනුර මහතා
15. සභාපති සංචාරක ප්‍රවර්ධන අධිකාරිය
16. සයිටිස් ශ්‍රී ලංකා ලේකම් කාර්යාලයේ ප්‍රධානී ආචාර්ය සෙව්වන්දි ජයකොඩි මහත්මිය



ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්ලාස්ටික් වතුර බෝතල් භාවිතය




ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ප්ලාස්ටික් වතුර බෝතල් භාවිතය



අරලියගහ මන්දිරයේ ප්ලාස්ටික් වතුර බෝතල් භාවිතය




අරලියගහ මන්දිරයේ ප්ලාස්ටික් වතුර බෝතල් භාවිතය



පොලිතීන් ආහාරයට ගන්නා වන අලියෙක්



පොලිතීන් ආහාරයට ගැනීමෙන් මිය යැදෙන වන අලියෙක්



පොලිතීන් සහ ප්ලාස්ටික් ජලයට එකතු වීම.



මසුන්ට වඩා ප්ලාස්ටික් සහ පොලිතින් සාගරයෙන් මතුවීම.

# Star class hotels to ban the use of plastic and polythene

vidya abhayagunawardena
Sat 2/24/2018 9:38 PM
To: chairman@srilanka.travel <chairman@srilanka.travel>

2 attachments (4 MB)
Press Relese (English) (1) (2).jpg; DWC.jpg;

**Mr. Kavan Ratnayaka**
**Chairman**
**Sri Lanka Tourism Development Authority**

**Dear Mr. Ratnayaka,**

**Subject: Star class hotels to ban the use of plastic and polythene**

As I briefly explained to you this evening most of the star class hotels in Sri Lanka still use plastic and polythene in their day to day businesses. Most recently I have noticed that Cinnamon Grand Colombo still serve disposable plastic bottles. Last week I informed this to the Cinnamon Grand authority and requested a meeting to discuss this matter with the General Manager Mr. Rohan Karr. This is totally contradictory to their parent company John Keels Holding is urging the corporate sector and public to not to use plastic and polythene. The JKH already launched a campaign in this regard.

Its of paramount importance that the entire hotel sector in Sri Lanka should work towards being plastic and polythene free. There will be a lot of opportunities for hotel business in terms of cost and social responsibility and their carbon footprint when they do not use of polythene and plastic. I would like to share with you below article published by the Green Hotelier which discusses that "**Hoteliers have a waste solution that's good for the environment and good for business.**"

From 4th of February 2018, the departments of Forests and Wildlife in Sri Lanka have banned the use of plastic and polythene inside their parks. Attached are press release and poster designed in this regard. Park visitors need to adhere to it and introduce alternatives to plastic and polythene.

We urge you to look in to this important matter seriously and as first step, the 5 Star category hotels and resorts in Sri Lanka could be encouraged to stop the use of plastic and polythene. This initiative could start with the Cinnamon Hotels and they can encourage others in the industry. Gradually this can spread to other star category hotels and eventually the entire tourism sector of Sri Lanka will go zero polythene and plastic in few years time. This will bring many benefits for all of us and at some point this will not be calculated merely in financial terms due to its positive environmental outcome.


Look forward to hearing for you soon.

With best regards,

Vidya Abhayagunawardena
Researcher - Socioeconomic Development, Environment and Disarmament
No. 69, Gregory's Road
Colombo 7.

Mob: 077 355 9878

http://www.greenhotelier.org/our-themes/waste/talking-point-hoteliers-have-a-waste-solution-thats-good-for-the-environment-and-good-for-business/



## Talking Point: Hoteliers have a waste solution that's good ...

www.greenhotelier.org

Talking Point: Hoteliers have a waste solution that's good for the environment and good for business